පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 7

# දෙවන වාර පරීක්ෂණය - 2019

පාසලේ නම : ..............................................................................................

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ..................................................
..............................................................................................................

කාලය : පැය 02 යි.

## ඉතිහාසය I , II

Education NCP - www.edncp.lk

### ඉතිහාසය - I

**සැලකිය යුතුයි :**

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

▪ **ප්‍රශ්න අංක 1 - 5 දක්වා ප්‍රශ්න වලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. නිසෙල්විටිය නම් ගමේ සොහොයුරන් එක්වී හේනක් වගා කළ බව සඳහන් මූලාශ්‍රය වන්නේ.

1) බුත්සරණ 2) මහාවංශය 3) සද්ධර්මරත්නාවලිය

02. දෙවන සේන රජුගේ සමයේ දේශපාලන ආධාර ඉල්ලා මෙරටට පැමිණි පාණ්ඩ්‍ය පාලකයා,

1) ශ්‍රී මාර ශ්‍රී වල්ලභ 2) නරසිංහ වර්මන් 3) දෙවන වරගුණවර්මන්

03. අන්ධයන් හා රෝගීන් සඳහා ආරෝග්‍ය ශාලා හා දාන ශාලා පිහිටවූ පාලකයෙකි.

1) පළමුවන උපතිස්ස රජු

2) බුද්ධ දාස රජු

3) පළමුවන උදය රජු

04. රුවන්වැලි සෑය අලංකාර කිරීමට සකස් කල පළඳනාවට පබළු ගෙන ඒමට දූතයන් පිටත් කළ රට වන්නේ,

1) පර්සියාව යි. 2) රෝමය යි. 3) ඉන්දියාව යි.

05. නගර ගිරිකිත්ති සෙනවියාට රජකෙනෙකුගෙන් ත්‍යාග ලෙස ලැබුණු ගම් බිම් ගැන සඳහන් වන සෙල්ලිපිය ලෙස සැලකෙනුයේ,

1) තෝනිගල සෙල්ලිපිය යි.

2) සංගමු විහාර සෙල්ලිපිය යි.

3) දෙවනගල සෙල්ලිපිය යි.

- **ප්‍රශ්න අංක 06 - 10 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුරු තෝරා තිත් ඉරි මත ලියන්න.**

06. ලාක්ෂා කර්මාන්තයට ................................ ශාඛයේ වසන කෘමියාගේ ශ්‍රාවයන් යොදා ගනියි.
( පන් , කැප්පෙට්ටියා )

07. ලංකාවට විරුද්ධ ප්‍රතිපත්තියක් අනුගමනය කළ බුරුම පාලකයා ........................................ රජු ලෙස සැලකෙයි. ( අලවුංසිතු , පරාක්‍රම පාණ්ඩ්‍ය )

08. සූප ශාස්ත්‍රයේ දක්ෂ කාන්තාවන් මූලාශ්‍ර වල හඳුන්වා ඇත්තේ ...................................... ලෙස ය.
( මධුපාචිකා , තිලෝක සුන්දරී )

09. මින්නේරිය වැව තැනවූ ................................... රජු පසු කාලයේ දී දේවත්වයෙන් සලකන ලදී.
( මහා පරාක්‍රමබාහු , මහසෙන් )

10. අනුරාධපුර යුගයේ අවසාන පාලකයා ......................................... රජු ලෙස සැලකෙයි.
( පස්වන මිහිදු , මහා විජයබාහු )

- **ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්න වලට ගැළපෙන පිළිතුර 'ආ' කොටසින් තෝරා ඊට අදාළ අක්ෂරය හිස්තැන මත ලියන්න.**

| 'අ' | | 'ආ' |
|---|---|---|
| 11. යකඩ වැඩ කරන්නන් | ( ) | A - වේවැල්කැටිය සෙල්ලිපිය |
| 12. පරාක්‍රමබාහු හා දෙවන ගජබාහු අතර ගිවිසුම සඳහන් සෙල්ලිපිය | ( ) | B- බදුලු ටැම් ලිපිය |
| 13. ගම් පාලනය කළ අය | ( ) | C- සංගමු විහාර සෙල්ලිපිය |
| 14. රට තුළ ක්‍රියාත්මක වූ නීති රීති සඳහන් සෙල්ලිපිය | ( ) | D- අශ අදෙක |
| 15. වෙළඳපළක පාලනය පිළිබඳ නීති රීති ඇතුලත් සෙල්ලිපිය | ( ) | E- ගම්ලද්දන් |
| | | F- ලෝකුරුවන් |

- **ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්න හරි නම් ( ✓) ලකුණ ද, වැරදි නම් ( ✗) ලකුණ ද වරහන තුළ යොදන්න.**

16. ලෝකයේ පැරණිම ගොවිතැන් ක්‍රමය ලෙස සැලකෙන්නේ හේන් ගොවිතැනයි. ( )
17. තවලම් රැගෙන ගිය ගවයන් කිරි ගෙරි ලෙස හඳුන්වා ඇත. ( )
18. විහාරාරාමයක පාලනය පිළිබඳ තොරතුරු මිහින්තලේ පුවරු ලිපියේ සඳහන්ව ඇත. ( )
19. පල්ලව රාජ්‍යයේ අගනුවර වූයේ තන්ජෝරයයි. ( )
20. අටවන අග්ගබෝධි රජු දිවා රාත්‍රී මවට උපස්ථාන කළ බව සඳහන් වෙයි. ( )

(ල. 20 × 2 = 40)

Education NCP - www.edncp.lk

# ඉතිහාසය - II

**සැලකිය යුතුයි :**

❖ **ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

01. (i) තෝනිගල සෙල් ලිපියෙහි සඳහන් පරිදි වගා කටයුතු සිදු කළ කන්න තුන නම් කරන්න. (ල:03)

(ii) වගා ආරක්ෂා කර ගැනීමේ දී හේන් ගොවියා අනුගමනය කළ සාම්ප්‍රදායික ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න. (ල: 04)

(iii) වී වගාවේ බිම් සකස් කර ගැනීමේ දී අතීත ගොවියා සිදු කළ කාර්යයන් තුනක් අනුපිළිවෙලින් ලියා ඉන් එකක් පැහැදිලි කරන්න. (ල: 05)

02. (i) පහත දැක්වෙන කර්මාන්ත ආශ්‍රිත ශිල්පීන් අතීතයේ මූලාශ්‍රයවල හඳුන්වා ඇති නාමයන් අනුපිළිවෙලින් ලියන්න.

A - පේෂ කර්මාන්තය

B - මැටි කර්මාන්තය

C - ලෝහ කර්මාන්තය (ල: 03)

(ii) බදුලු ටැම් ලිපියේ සඳහන් වෙළෙඳපොළ පාලනයට අදාළ නීති රීති දෙකක් ලියන්න. (ල: 04)

(iii) ශ්‍රී ලංකාව තුළ දියුණු විදේශ වෙළඳාමක් පැවති බවට උදාහරණ දෙකක් දක්වමින් විස්තර කරන්න. (ල: 05)

03. (i) මහා විජයබාහු රජතුමා පිළිබඳ තොරතුරු සඳහන් වන මූලාශ්‍ර තුනක් නම් කරන්න. (ල: 03)

(ii) අනුරාධපුර යුගයේ දී රාජ්‍ය උරුමය හිමිවූ ප්‍රධාන ආකාර දෙක සඳහන් කරන්න. (ල: 04)

(iii) මහා පරාක්‍රමබාහු රජතුමා පොළොන්නරු රාජධානියේ සිටි ශ්‍රේෂ්ඨ පාලකයෙකි. එම රජතුමාගේ සේවාවන් තුනක් ලියා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල: 05)

04. (i) අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලනයට සම්බන්ධ වූ පහත නිළධාරීන් A B C අනුපිළිවෙලින් හඳුන්වන්න.

A) සේනාපති -

B) මහා ලේඛක -

C) අස අදෙක - (ල: 03)

(ii) අනුරාධපුර යුගයේ රටේ නීති පද්ධතිය තුළපැවති ප්‍රධාන නීති වර්ග හතරක් නම් කරන්න. (ල: 04)

(iii) අනුරාධපුර යුගය අවසානයේ දී මෙරටට බලපෑම් එල්ල කළ දකුණු ඉන්දියානු රාජ්‍ය තුනක් නම් කොට ඉන් එක් රාජ්‍යයක් පිළිබඳ කෙටි විස්තරයක් කරන්න. (ල: 05)



Education NCP - www.edncp.lk

05. (i) පහත පින්තූරය අධ්‍යයනය කර අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A - මෙම පින්තූරය නම් කරන්න.

B - මෙය හමු වී ඇති ස්ථානය නම් කරන්න.

C - මෙහි දක්නට ලැබෙන චිත්‍ර කුමන රාජධානි සමයකට අයත්වේ ද ?

(ල: 03)

(ii) පහත සඳහන් වගුව පිටපත් කර ස්පෘශය හා අස්පෘශ්‍ය උරුම වලට නිදසුන් දෙක බැගින් වෙන වෙනම ලියන්න.

| ස්පෘශ්‍ය උරුම | අස්පෘශ්‍ය උරුම |
|---|---|
| I.<br><br>II. | I.<br><br>II. |

(ල: 04)

(iii) සීගිරියේ ගෘහ නිර්මාණ ශිල්පය හා ජල තාක්ෂණය පිළිබඳ උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ල: 05)

06. (i) ශ්‍රී ලංකාවේ විදේශ වෙළඳාම හා සම්බන්ධ වූ ප්‍රධාන වරායන් තුනක් නම් කරන්න. (ල: 03)

(ii) හින්දු මූලාශ්‍ර වල දක්වෙන පරිදි පහත සඳහන් සිරිත් විරිත් කුමන අවස්ථා වලදී යොදා ගත්තේ දැයි

ලියා දක්වන්න.

A) නාම කරණ
B) විද්‍යාරම්භ
C) අන්නප්‍රාශාන
D) ජාත කර්ම (ල: 04)

(iii) ජන කවි අපේ සංස්කෘතික උරුමයේ සුවිශේෂී අංගයකි. ජන කවි වල දක්නට ලැබෙන ලක්ෂණ තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල: 05)

07. (i) අනුරාධපුර රාජධානියේ රාජ්‍යත්වයට පත් වූ රාජ වංශ තුනක් නම් කරන්න. (ල: 03)

(ii) දෙවන සේන රජුගේ සේවාවන් දෙකක් ලියා දක්වන්න. (ල: 04)

(iii) නිශ්ශංකමල්ල රජතුමා මුහුණ දුන් අභියෝග තුනක් නම් කර ඉන් එකක් කෙටියෙන් විස්තර කරන්න. (ල: 05)

***

Education NCP - www.edncp.lk
PAST PAPERS WIKI


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
GUIDE PAST PAPERS
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440